37

# මනිපුරි නර්තන සම්ප්‍රදායෙහිදි භාවිත තත් සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩ

*ඩබ්. ඩී. එස්. පී. ගුණතිලක* [1]
HU/2011/0263

උත්තර භාරතයේ මනිපූර් නම් ප්‍රාන්තයෙහි  ජනප්‍රිය මනිපුරි නර්තන සම්ප්‍රදායෙහිදි භාවිත කරනු ලබන තත් සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩ පිළිබඳ අධ්‍යයනයක නියැලීම මෙහි අධ්‍යාශයයි. එමඟින් මනිපුරි නර්තන සම්ප්‍රදායෙහි භාවිත එක් එක් තත් සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව ද අධ්‍යයනයක් ලබා ගැනීමට හැකිවීම මෙමඟින් ලැබුණු සුවිශේෂ අවස්ථාවකි. මනිපුරි නර්තන සම්ප්‍රදායෙහි විශේෂත්වය වන්නේ එකී ප්‍රදේශයේ ජනප්‍රිය ගැමි සහ ආගමික නැටුම්වලින් සමන්විත වීමයි. ඉන්දියාවේ ජනප්‍රිය අනෙකුත් නර්තන සම්ප්‍රදාවලින් මනිපුරි නර්තනය වෙනස් වන්නේ ද මෙකී හේතුව නිසා ය. මෙකී ගැමි සහ ආගමික නැටුම්වලදී භාවිත තත් සහ අවනද්ධ භාණ්ඩ වඩාත් සංයමයකින් සහ රිද්මයානුකූල ආකාරයකින් මනිපුරි නර්තනයෙහි දී යොදාගනු ලැබීම මනිපුරි හි සම්භාව්‍ය ගුණය කෙරෙහි පසුබිම් වී ඇති බව ප්‍රකට වෙයි. එහෙයින් මෙම අධ්‍යයනය මගින් මනිපුරි නර්තන සම්ප්‍රදාය සඳහා තත් සහ අවනද්ධ භාණ්ඩ ඉවහල් වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම ද වැදගත්ය. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍යමය මූලාශ්‍ර මෙන්ම විද්‍යුත් මාධ්‍ය භාවිත කොට ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදු කරන ලදි. එමගින් මෙම තත් සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩයන්ගේ භාවිතය පිළිබඳ ව ත් භාවිතා කරනු ලබන අවස්ථා, වාද්‍ය භාණ්ඩයන්හි විශේෂතා නිර්මාණය යනාදි සියල්ලක් පිළිබඳ ව ම වැඩි වශයෙන් අවබෝධයක් ලබාගත හැකි විය. ඊට අමතරව මනිපුරි නර්තන සම්ප්‍රදායෙහිදී මුලිකව දැන සිටි ප්‍රධානතම වාද්‍ය භාණ්ඩයන්ට අමතර  මුල් කාලයේදි භාවිතා කරන ලද පෞරාණික වාද්‍ය භාණ්ඩ පිළිබඳ ව ද අධ්‍යයනයක් කිරීමට හැකිවිය. ඒ අනුව, පර්යේෂණය අවසන් වන විට මනිපුරි නර්තන සම්ප්‍රදායෙහිදි භාවිතා වන තත් සහ අවනද්ධ වාද්‍ය භාණ්ඩයන් පිළිබඳ හඳුනා ගැනීමත් ඒවා පිළිබඳ  පුළුල් අවබෝධයක් ලබා ගැනිමටත් හැකිවිය.

ප්‍රමුඛ පදඃ මනිපුරි, ඉන්දීය ගැමි නැටුම්, ශාස්ත්‍රීය නර්තනය, තත් භාණ්ඩ, අවනද්ධ භාණ්ඩ

1 ප්‍රාසංගික කලා (විශේෂවේදී) තෙවන වසර